INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

2020 ජූනි 1

**මාධ්‍ය නිවේදනය: තවත් ගැටළු සහගත හමුදා උසස්වීම්**

**ජොහැන්නස්බර්ග්:** 2009 දී අත් අඩංගුවේ සිටි දෙමළ වෛද්‍යවරයකුට දියයුතු වෛද්‍ය ප්‍රතිකාර වලක්වා තර්ජනය කරමින් බලහත්කාරයෙන් අසත්‍ය ප්‍රකාශ කරවූ බවට චෝදනා ලබන හිටපු හමුදා බුද්ධි අධ්‍යක්ෂ තුවාන් සුරේෂ් සලේ ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා විසින් මේජර් ජෙනරාල් පදවියට උසස් කොට තිබේ. රජයේ වෛද්‍යවරයකු වූ දොස්තර තුරෙයිරාජා වර්ධරාජා 2009 යුද කලාපයේ සේවය කොට, ඉන් අනතුරුව යුද්ධය අවසානයේදී දින සියයක් පමණ රඳවා තබාගනු ලැබුවෙකි. නඩු විභාගයකින් තොරව ඒ තරම් දීර්ඝ කාලයක් රඳවා තබා ගැනීම වධහිංසාවට එරෙහි සම්මුතිය උල්ලංඝනය කරමින් කෲර අමානුෂික සැළකිලි සහ දඬුවම් පැමිණවීමකි.

*“මානසික වධහිංසාව සහ වෛද්‍ය ප්‍රතිකාර අහිමි කිරීම යන මේ චූදිත චර්යාව ශ්‍රී ලංකාව ද අත්සන් තබා ඇති වධහිංසාවට එරෙහි සම්මුතිය උල්ලංඝනය කිරීමක් මෙන්ම විධාන වගකීම උසුලන්නන් විශ්ව විනිශ්චය ඇතුළු ක්‍රම යටතේ වගඋත්තරකාරීත්වයෙන් බැඳ තැබිය හැකි වන්නකි,”* යි සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතියේ (ITJP) විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය. *“අතිශය නිර්භීත රජයේ සේවකයකු වන දොස්තර වර්ධරාජා තමන් දැවැන්ත අනතුරකට මුහුණ පා සිටියදී දහස් සංඛ්‍යාත ජීවිත ගලවාගත් වෛද්‍ය කණ්ඩායමක් මෙහෙයැවුවෙකි. ඔහුට දියයුතුව තිබුනේ සම්මානයකි. සිර කුටියක් නොවේ.”*

තමන්ගේ ආරක්ෂාව පතා රටින් පලා ගිය දොස්තර වර්ධරාජා මේ දිනවල එක්සත් ජනපදයේ කෝවිඩ් 19 රෝගීන්ට ප්‍රතිකාර කිරීමේ යෙදී සිටී. යුද්ධයේ දී සාමාන්‍ය වැසියන් මියගිය පරිමාණය ප්‍රතික්ෂේප කරන්නට තමන්ට සහ අනිකුත් වෛද්‍යවරුන්ට බල කොට සංවිධානය කරන ලද කොළඹ මාධ්‍ය හමුවකදී අසත්‍ය ප්‍රකාශ කිරීමට තමන්ට බලපෑම් කළ සහ එම ප්‍රකාශය සකස් කළ හමුදා බුද්ධි අංශ නිලධාරියා සුරේෂ් සලේ ලෙස දොස්තර වර්ධරාජා විසින් හඳුනාගෙන තිබේ.

*"අවුරුදු ගණනකට හිරේ යවනවා කියලා කර්නල් සුරේෂ් අපිට තර්ජනය කළා... අපේ පවුල් වලටත් තර්ජනය කළා,”* යි පැවසූ වෛද්‍යවරයා, තමන් කටයුතු කරන්නේ ඒ සමයේ බලසම්පන්න ආරක්ෂක ලේකම් වූ ගෝඨාභය රාජපක්ෂගේ නියමය පරිදි බව සුරේෂ් සලේ පැහැදිලිවම කීවේ යැයි සඳහන් කළේය.

තර්ජන වලට අමතරව, යුද්ධයෙන් බරපතල ලෙස තුවාල වී තිබුණු සිය අතට ශල්‍යකර්මයක් කිරීම අත්‍යාවශ්‍ය වී තිබුණේය යන්න සිය කැමැත්තට එරෙහිව මාධ්‍ය සාකච්ඡාවට සහභාගී කරවා ගැනීම සඳහා බල කිරීමට යොදාගත් බවත් දොස්තර වර්ධරාජා චෝදනා කරයි. වෛද්‍යවරයාට ශල්‍යකර්මයට ඉඩ

සැලසීම පමා කිරීම නිසා ඔහුගේ අතේ වේදනාව, සංවේදන ගැටළු සහ ශල්‍ය වෛද්‍යවරයකුට අවශ්‍ය සියුම් සංචලන හැකියාව අහිමිවීම ශේෂ වී තිබේ[1].

තුවාලකරුවන්ට ප්‍රතිකාර කිරීම සඳහා යුද කලාපයේ රැඳී සිටි දෙමළ වෛද්‍යවරුන් ලෝකයේ ජනමාධ්‍ය වලට ඉතා වැදගත් වන යුද සමයේ තොරතුරු සැපයීමේ අත්‍යාවශ්‍ය කාර්යභාරය ඉටු කළ පුද්ගලයන් ලෙසින් දේශසීමා නොමැති වාර්තාකරුවෝ (RSF) විසින් ඇගයීමට ලක් කෙරුණි[2]. ඒ කාර්යභාරය නිසා යුද්ධය අවසානයේ ඔවුහු ඉලක්ක බවට පත් වූහ. 2009 ජුලි 8 වැනිදා මාධ්‍ය හමුවකදී බොරු කීමට බල කරන ලද දොස්තර වර්ධරාජා ඇතුළු වෛද්‍යවරුන්ට ඔවුන්ගේ රැකවල් කරුවන් විසින් ඉන් අනතුරුව ආපසු කූඩු කිරීමට පෙර දෙන ලද අරුම පුදුම සංග්‍රහයක් සඳහා  කෙන්ටකි ෆ්‍රයිඩ් චිකන් අවන් හලට කෑම වේලකට විකාරරූපී ලෙස කැඳවාගෙන ගොස් තිබේ[3].

වෛද්‍යවරුන්ගේ “පාපොච්චාරණ” වල සත්‍යතාව පිළිබඳව බොහෝ ජාත්‍යන්තර නිරීක්ෂකයන් සැක පහල කළ බව ඒ සමයේ එක්සත් ජනපද කේබල් පණිවිඩ මගින් පිළිගෙන තිබුණි[4]. විකිලීක්ස් විසින් ප්‍රසිද්ධියට පත් කරන ලද කේබල් පණිවිඩයක සඳහන් වන පරිදි වෛද්‍යවරුන් විසින් තානාපති අංශ වලට පවසා ඇත්තේ මාධ්‍ය හමුවට සහභාගී වීමට බල කරන ලද ඔවුන්, *“මාධ්‍ය හමුව වෙනුවෙන් තදින් පුහුණු කොට, කිව යුතු නිශ්චිත වාක්‍ය බාරදී, දේශීය ජනමාධ්‍ය ආයතන සාමාජිකයන් යොදවා කල්තියාම පුහුණු වීම් පවා කරවන,”* ලද බවයි. මීට අමතරව, *“අත් අඩංගුවේ සිටියදී ආරක්ෂක ලේකම් පැමිණ ඔවුන්ගෙන් කිහිප වතාවක් ප්‍රශ්න කළ බව,”* දොස්තරවරුන් ප්‍රකාශ කළේ යැයි  ටෙලෙක්ස් මගින් වාර්තා කර තිබුණි[5].

විකාර සහගත ලෙස වෛද්‍යවරුන්ට දී තිබුණු උපදේශය වී ඇත්තේ යුද්ධයේ අවසන් මාස පහේ මියගිය සංඛ්‍යාව 650ක් පමණක් බව මාධ්‍ය හමුවේදී කියන ලෙසයි[6].  ඒ, මරණ සංඛ්‍යාව ඊට වැඩි බව ඊට පසු කලෙක දී ආණ්ඩුව විසින්ම පිළිගෙන තිබියදීය.  එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සුපරීක්ෂාකාරීව ගණන් බලා තක්සේරු කරන ලද 2009 අප්‍රේල් දක්වා හානියට පත්වූවන්ගේ සංඛ්‍යාව පසෙක තැබුවත්, හුදෙක් ඡායාරූප වල දැක්වෙන මල සිරුරු ප්‍රමාණය පමණක් වුවද පහසුවෙන්ම ඒ සංඛ්‍යාව ඉක්මවනු ඇත. ශ්‍රී ලංකාවේ ආණ්ඩුව “යුද්ධයේ අවසන් සති හා දින වලදී සිද්ධවූ නිරායුද පුද්ගලයන් විඳි දුක් සහ මරණ වල පරිමාණය යටපත් කිරීමට දිගටම උත්සාහ කරන,” බව එවක එක්සත් ජනපද රාජ්‍ය තාන්ත්‍රික ටෙලෙක්ස් පණිවිඩ වල දැක්වේ. අන්තිමේදී නිදහස් කර යැවීමෙන් පසු වෛද්‍යවරුන් පැහැරගැනීමේ හෝ අනීතිකව ඝාතනය කිරීමේ අවදානමට ගොදුරු වේදැයි තානාපති නිලධාරීහු ඒ සමයේ බිය පල කළහ[7]

මීට අමතරව, 2009 දී සන්ඩේ ලීඩර් කර්තෘගේ මරණය සම්බන්ධ විමර්ශනයට අදාලව 2016 දී අධිකරණය හමුවේ පෙනී සිටින ලෙස සුරේෂ් සලේ කැඳවා තිබුණි[8]. සලේ ගේ ප්‍රධාන සහායකයා ලසන්ත නඩුවේ සැකකරුවකු ලෙස  2016 පැවති හඳුනාගැනීමේ පෙරෙට්ටුවකදී හඳුනා ගන්නා ලද බව වාර්තාවන අතර, දෙවැනි සැකකාර කන්දෙගෙදර පියවංශ, සලේ ගේ පුද්ගලික කාර්ය මණ්ඩලයේ අයෙකි[9].

යුද හමුදා බුද්ධි අංශ සාමාජිකයන් විසින් පැහැරගෙන ගොස් රඳවා තබාගත් බවට පොලිස් පරීක්ෂණ වලදී හෙළිවූ ප්‍රගීත් එක්නැලිගොඩ 2010 අතුරුදහන් කරනු ලැබීම පිළිබඳ  විමර්ශන සඳහාද අධිකරණයට ඔහු කැඳවා තිබුණි. සැකකරුවන්ට ඇප ලබාගැනීමට උදව්වක් ලෙසින් රජයේ නීතිඥයා නඩුවෙන් ඉවත් කිරීමට සුරේෂ් සලේ උත්සාහ ගත් බව ඒ සමයේ පුවත්පත් වාර්තාවල චෝදනා නගා තිබුණි[10]. ස්වකීය විමර්ශන වලට සුරේෂ් සලේ සහාය නොදෙන බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව චෝදනා කිරීමෙන් අනතුරුව ඔහු හමුදා බුද්ධි අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් කරන ලෙස සිවිල් සමාජ කණ්ඩායම් ඉල්ලීම් කර තිබුණි[11].

---

[1] The operation on his hand only took place in August 2009 as confirmed by Wikileaks cable 09COLOMBO830_a.
[2] https://reliefweb.int/report/sri-lanka/sri-lanka-army-holding-three-doctors-who-gave-information-press
[3] https://www.bbc.co.uk/programmes/p02w11dv, Witness, BBC, Tamil Doctors and the Sri Lankan War, 8 July 2015.
[4] 09COLOMBO695_a, 13 July 2009.
[5] 09COLOMBO830_a, 24 August 2009.
[6] 09COLOMBO695_a, 13 July 2009.
[7] 09COLOMBO830_a, 24 August 2009.
[8] http://www.thesundayleader.lk/2016/06/19/two-key-army-officers-to-appear-in-court/
[9] Military Intelligence Chief Replacement Inevitable, 31 July 2016,
http://www.thesundayleader.lk/2016/07/31/military-intelligence-chief-replacement-inevitable/
[10] Army Commander In A Soup?, 24 Jan. 2016, Sunday Leader, http://www.thesundayleader.lk/2016/01/24/army-commander-in-a-soup/
Startling Details Emerge In Keith Noyahr Abduction Probe, The Sunday Leader, 26 feb 2017,
http://www.thesundayleader.lk/2017/02/26/startling-details-emerge-in-keith-noyahr-abduction-probe/
[11] Sri Lanka: 2016 —The year of National Security Rhetoric, 29 Dec. 2016, Sl Guardian. https://www.slguardian.org/2016/12/sri-lanka-2016-the-year-of-national-security-rhetoric/
Oct 23, 2016, Sri Lanka police spies attacked in Jaffna fuelling tensions,Economy Next,
http://www.economynext.com/Sri_Lanka_police_spies_attacked_in_Jaffna_fuelling_tensions-3-6431-10.html
Sri Lanka removes intelligence chief after Jaffna disturbances, 2 Nov 2016, AFP, http://www.arabnews.com/node/1005841/world

වද දීමට සම්බන්ධ බවට චෝදනා ලබන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ තවත් සමීපතමයකු වන ප්‍රසන්නද අල්විස් පසුගිය සතියේ ශ්‍රී ලකාවේ ජනාධිපති විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී[12]. ලසන්ත වික්‍රමතුංග ඝාතනයට හිටපු හමුදාපති සරත් ෆොන්සේකා ගාවා දුන්නොත් රජයේ විත්තිකරුවකු කරන සහ රට රැකියා ලබා දෙන බවට පොරොන්දු දෙමින් අල්විස් 2016දී බලපෑම් කිරීමට උත්සාහ කළේ යැයි චෝදනා කරමින් සුරේෂ් සලේගේ කාර්ය මණ්ඩල සාමාජික කන්දේගෙදර පියවංශ 2016 දී විවෘත අධිකරණයේ ප්‍රකාශයක් කළේය.

*"අප මේ දකිමින් සිටින්නේ අවුරුදු ගණනාවක් තිස්සේ ආරක්ෂක සේවාවල එකිනෙකා ආරක්ෂා කර ගනිමින් කල් ගත කළ අපරාධ සම්බන්ධයෙන් චෝදනා ලබන්නවුන්ගේ සංකීර්ණ ජාලයක් ජනාධිපතිවරයා විසින් ඉහලම තනතුරු වලට පත් කරනු ලැබීමයි,"* යනුවෙන් යැස්මින් සූකා පැවසුවාය. *"කිසියම්ම හෝ ආකාරයක ආයතනික ප්‍රතිසංස්කරණයක් ගැන කතා කිරීම අපහසු වන තරමටම දණ්ඩ මුක්තිය කිඳා බැස තිබේ".*

නිමයි.

[12] https://itjpsl.com/assets/press/English-26-May-2020-Alwis-press-release.pdf

INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT